# සිංහල භාෂාව හා සාහිත්‍යය

6 ශ්‍රේණිය



විෂය : සිංහල භාෂාව හා සාහිත්‍යය

ශ්‍රේණිය : 6 ශ්‍රේණිය

වාරය : දෙවන වාරය

ඒකකය - නලපාන ජාතකය

නිපුණතාව : 2.0 ජීවන අත්දැකීම් පුළුල් කර ගැනීම සඳහා කියවීමේ පුරුදු අර්ථවත් ව යොදා ගනියි.

නිපුණතා මට්ටම : 2.2 විවිධ ශෛලියෙන් රචිත පොත පත කියවයි.

අරමුණු

- විවිධ ශෛලීන් හඳුනාගෙන කියවයි.
- උචිත ශෛලියකට අනුගත ව කියවයි.
- විවිධ ශෛලිවලට අනුව ලියැවුණු පොතපත රස මතුවන අයුරින් කියවයි.
- විවිධ ශෛලිවලට අනුව කියවීමෙන් රස ජනනය වන බව පිළිගනියි.

# සිංහල භාෂාව හා සාහිත්‍යය | 6 ශ්‍රේණිය

## 1. හිස්තැනට ගැළපෙන පිළිතුර වරහන් තුළින් තෝරා ලියන්න.

I නලපාන ජාතකය පාඩම උපුටා ගත් ග්‍රන්ථය වනුයේ ......... **(පන්සිය පනස් ජාතක කතා පොත/සද්ධර්මරත්නාවලිය)**
II එය ...... යුගයේ දී රචනා වී ඇත. **(කෝට්ටේ යුගයේ/කුරුණෑගල යුගයේ)**
III මෙය රචනා කිරීම සඳහා ආරාධනා කරන ලද්දේ ...... ය. **(පණ්ඩිත පරාක්‍රමබාහු/වීරසිංහ ප්‍රතිරාජ අමාත්‍යවරයා)**
IV මෙකල රාජ්‍ය පාලනය කරන ලද්දේ ...... ය. **(සතරවැනි පරාක්‍රමබාහු රජතුමා/දෙවනි පරාක්‍රමබාහු රජතුමා)**
V මෙහි සම්පූර්ණ කතා ....... කි. (543/547)

## 2. අරුත් ගැළපෙන සේ යා කරන්න.

| අ | ආ |
|---|---|
| අතුල් තල | අමනුෂ්‍යයන් අරක් ගත් |
| අමනුෂ්‍යාධිගෘහීත | ඉදි කටු දමන කොපුව |
| ආවර්ජනා කෙරෙමින් | සුදු මානෙල් |
| ඇඹුල් | මෙනෙහි කරමින් |
| ඉදිකටු කුළා | අල්ල |

## 3. පහත සඳහන් ප්‍රකාශ කවුරුන් විසින් ප්‍රකාශ කරන ලද්දේ දැයි තෝරන්න.

I මේ මාගේ පුරාතනයෙහි අධිෂ්ඨානයෙකැ **(බුදුරජාණන් වහන්සේ විසින්/ වඳුරු නායකයා විසින්/මහෞෂධ පණ්ඩිතයන් විසින්)**
II "දරුවෙනි, මේ වනයෙහි විෂ වෘක්ෂයෝත් අමනුෂ්‍යාධිගෘහීත වූ පුෂ්කරණීහුත් වෙති" **(බුදුරදුන්/ වඳුරු නායකයා/ භික්ෂූන් )**
III "නුඹ වහන්සේ එන තෙක් බලා උනුම්හ" **(බෝධිසත්වයෝ/උදක රාක්ෂයා/වඳුරු පිරිස)**
IV "පොකුණට බැස පැන් බොව" **( උදක රාක්ෂයා/වාඳුරු නායකයා/ භික්ෂූන් )**
V **"පොකුණට බටුවන් කන්ට ලැබෙන්නේ දැ"** **(වඳුරු පිරිස/ මහණ පිරිස/වඳුරු නායකයා)**

## 4. නලපාන ජාතකයේ ඔබ සිත් ගත් අවස්ථාවක් චිත්‍රයට නගන්න.

**5. පහත සඳහන් ප්‍රශ්න ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.**

I නරි බෑනා නාට්‍යයේ රචකයා කවු ද?

II මෙම නාට්‍යයේ එන චරිත තුනක් නම් කරන්න.

III නරි ගෙදර ගම දුව හඬමින් සිටින අවස්ථාවේ නරියා ඇය සැනසුවේ කෙසේ ද ?

IV ගම දුවගේ අම්මලා දුව බැලීමට එන දවසට රැගෙන එනවා යැයි නරියා පවසන්නේ මොනවා ද ?

V නරි බෑනා නාට්‍යයේ ඔබ වඩාත් සිත් ගත් එක් චරිතයක් පිළිබඳ විස්තර කරන්න.

**6. නිවැරදි අක්ෂරය යොදා හිස්තැන් සම්පූර්ණ කරන්න.**

**I** ප්‍රති_පූර්ණ **(බා/භා)**
**II** භායා_ක **(න/ණ)**
**III** මහ_ **(ලු/ළු)**
**IV** පරීක්_ණය **(ශ/ෂ)**
**V** පරිච්_දය **(ජේ/ඡේ)**

**7. හිස්තැනට ගැළපෙන වචනය යොදා වාක්‍ය සම්පූර්ණ කරන්න.**

I මී මැස්සා .................. මත ද නීල මැස්සා .................. කුණු මත ද වසයි. **(මල/ මළ)**

II කුඩුවේ සිර වී .................. ක් නොමැති ව සිටින බලු පැටියාට තමන් වසන නිවසෙන් පිට පාරේ නිදහසේ .................. බල්ලෙකු දැකීමෙන් සිතට ඇති වූයේ දැඩි වේදනාවකි. **(සරන/ සරණ)**

III සිරිපාලට පෙර දිනක .................. මැදින් ඇවිදගන යනවිට පයේ පැටළුණු කටු අත්ත නිසා හටගත් .................. නිසා දැන් දැන් මහත් වේදනාවක් දැනෙයි. **(වනය/වණය)**

IV ..................ගිය සුමනදාසට හීන් දාඩිය දැම්මේ පෙර දා රැයේ ඇද හැළුණු මහා වර්ෂාව නිසා පීදී තිබූ බඩ ඉරිඟු .................. ටිකට සිදු ව ඇති විනාශය දුටු විටයි. **(පැල/පැළ)**

V විජයබාහු රජ රාජ්‍යය කරන .................. උදව් .................. ප්‍රභූන්ට ගම්වර දුන්නේ ය. **(කල/කළ)**

# නලපාන ජාතකය

**පිළිතුරු පත්‍රය**

**1.**

I. පන්සිය පනස් ජාතක කතා පොත
II. කුරුණෑගල යුගයේ
III. වීරසිංහ ප්‍රතිරාජ අමාත්‍යවරයා
IV. සතරවැනි පරාක්‍රමබාහු රජතුමා
V. 547

**2.**

| අ | ආ |
|---|---|
| අතුල් තල | අමනුෂ්‍යයන් අරක් ගත් |
| අමනුෂ්‍යාධිගෘහීත | ඉදි කටුන දමන කොපුව |
| ආවර්ජනා කෙරෙමින් | සුදු මානෙල් |
| ඇඹුල් | මෙනෙහි කරමින් |
| ඉදිකටු කුළා | අල්ල |

**3.**

I. බුදුරජාණන් වහන්සේ විසින්
II. වඳුරු නායකයා
III. වඳුරු පිරිස
IV. උදක රාක්ෂසයා
V. වඳුරු නායකයා

**4.**

**නලපාන ජාතකයේ සිත් ගත් අවස්ථාවක් චිත්‍රයට නගා තිබිය යුතු ය.**

**5.**

**I** දයානන්ද ගුණවර්ධන

**II** ගම දුව, ගම මහගෙ , ගමරාල, නරියා, කපුරාල

**III** "දැන් ඉතින් ඔහොම කණගාටුවෙන් ඉන්න එපා මොකද්ද ඉතින් කණගාටුවෙන් ඉන්න තියෙන හේතුව.සත්තු උණාට අපිත් දන්නවා දීග කන හැටි "

**IV** දුවගේ දැවැද්ද

**V** නරි බෑනා නාට්‍යය වඩාත් සිත් ගත් චරිතයක් පිළිබඳ විස්තර කර තිබිය යුතු ය.

**6.**

I. හා
II. න
III. ලූ
IV. ෂ
V. ජේ

**7.**

I. Ⅰ මී මැස්සා **මල** මත ද නීල මැස්සා **මළ** කුණ මත ද වසයි.
II. Ⅱ කුඩුවේ සිර වී **සරණ**ක් නොමැති ව සිටින බලු පැටියාට තමන් වසන නිවසෙන් පිට පාරේ නිදහසේ **සරන** බල්ලෙකු දැකීමෙන් සිතට ඇති වූයේ දැඩි වේදනාවකි.
III. Ⅲ සිරිපාලට පෙර දිනක **වනය** මැදින් ඇවිදගන යන විට පයේ පැටළුණු කටු අත්ත නිසා හටගත් **වණය** නිසා දැන් දැන් මහත් වේදනාවක් දැනෙයි.
IV. Ⅳ **පැල**ට ගිය සුමනදාසට හීන් දාඩිය දැම්මේ පෙර දා රෑයේ ඇද හැළුණු මහා වර්ෂාව නිසා පීදී තිබූ බඩ ඉරිඟු **පැළ** ටිකට සිදු ව ඇති විනාශය දුටු විටයි.
V. Ⅴ විජයබාහු රජ රාජ්‍යය කරන **කල** උදව් **කළ** ප්‍රභූන්ට ගම්වර දුන්නේ ය.